# සිංහල

## 5 ශ්‍රේණිය





Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# 8 පාඩම

## ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග පද යොදා වැකි ලිවීමට හුරුවෙමු.

### පියවර 1

- අපි දැන් පහත සඳහන් ඡේදය හඬ නගා කියවමු.

අප පාසලේ සිංහල භාෂා තරගවලින් ජය ලබා ගත් සිසු සිසුවියන් සඳහා ත්‍යාග සහ සහතික පත් බෙදා දීමේ උත්සවය පසුගිය දා විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්විණි. එම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා ය.

විශේෂාංග කිහිපයකින් අනතුරුව යෙදුණේ ත්‍යාග සහ සහතික පත් බෙදා දීමේ අවස්ථාවයි. ප්‍රථමයෙන් ම විද්‍යාලයේ ලේඛන කුසලතා දැක්වූ සිසු සිසුවියන්ට ත්‍යාග සහ සහතික පත් බෙදා දීම සිදුවිණි.

ප්‍රාථමික අංශයේ දක්ෂතම ලේඛකයා වූයේ පස්වන ශ්‍රේණියේ උතුල දම්සර යි. දක්ෂතම ලේඛිකාව වූයේ එම ශ්‍රේණියේ ම උදාරි ප්‍රාර්ථනා ශිෂ්‍යාව යි. තිසරු පබසර දක්ෂතම කවියාට හිමි ත්‍යාගය ලබාගත් අතර, සයුරංගි තක්ෂිලා දක්ෂතම කිවිඳියට හිමි සහතිකය ලබා ගත්තා ය.

නාට්‍ය තරගවලින් ප්‍රථම ස්ථානය ලැබුවේ, මගේ පන්තියේ සිසුන් රඟ දැක්වූ "උත්සාහයෙන් ජය ලැබූවෝ" නාට්‍යය යි. එම නාට්‍යයේ ප්‍රධාන චරිත වන්නේ ගමේ ජීවත්වුණු ගොවියෙකු සහ ගෙවිලියකි. ගොවියා ඉතාම අලස තැනැත්තෙකි. ඔහු තුළ දියුණු වීමට කිසිදු උත්සාහයක් නොමැත. එහෙත් ගෙවිලිය ඉතා ම කඩිසර ය. දිරිමත් ය. ඇය තම කුඩා දරුවා සහ දැරිය රැගෙන උදැසනින් ම යන්නේ ගොවිබිමට යි. ඇයගේ උනන්දුව හා කැපවීම නිසා අවසානයේ දී ගොවියා ද කාර්යශූර අයෙකු බවට පත් වූ ආකාරය එම නාට්‍යයේ තේමාව විය.

( ගුරු මාර්ගෝපදේශයෙන් උපුටා ගන්නා ලදි.)

## පියවර 2

- ඡේදයේ සඳහන් ඉරි ඇඳි පද පුරුෂ ලිංග නාම පද හා ස්ත්‍රී ලිංග නාම පද ලෙස හඳුනා ගනිමු.

ලේඛකයා → ලේඛිකාව

**කවියා** → **කිවිඳිය**

**ගොවියා** → **ගෙවිලිය**

**ඔහු** → **ඇය**

**දරුවා** → **දැරිය**

## පියවර 3

**පහත සඳහන් පුරුෂ ලිංග හා ස්ත්‍රී ලිංග පද යෙදුණු වැකි හඬ නගා කියවර්තමාන**




අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඹපනායක

**කාලය**

පියවර 4

## අතීත කාලය




අන්ර්තගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක

## පියවර 5

- ඉහත මල් දෙකෙහි සඳහන් වැකි නැවත හඬ නඟා කියවමු. අවබෝධ කර ගනිමු.වැකි ලියමු. (ඔබ ලියූ වැකි නිවැරදි දැයි වැඩිහිටියන්ගෙන් අසා දැන

ස්ත්‍රී ලිංග නාම පද යෙදුණු වැකි 03 ක් (වර්තමාන කාලය )

1.............................................................................................................
.........

2.............................................................................................................

ස්ත්‍රී ලිංග නාම පද යෙදුණු වැකි 03 ක් (අතීත කාලය)

1.............................................................................................................
....

2.............................................................................................................

පුරුෂ ලිංග නාම පද යෙදුණු වැකි 03ක් (වර්තමාන කාලය)

1.............................................................................................................
......

2.............................................................................................................

පුරුෂ ලිංග නාම පද යෙදුණු වැකි 03 ක් (අතීත කාලය)

1.............................................................................................................
........

2.............................................................................................................

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක



<u>දැනුම පොතට</u>

ගොඩබිම වාසය කරන සතුන් අතරින් ඉතා කෙටි කාලයකදී
මිනිසාට වඩාත් සමීපව මිනිසා අනුකරණය කළ පුදුමාකර
*සත්වයෙකි ඩොල්ෆින් මත්ස්‍යයා.*
ලංකාවට අයත් මුහුදේද ඩොල්ෆින් බහුලව දක්නට
ලැබේ. බුද්ධියෙන් ඉහල සත්ත්ව කොට්ඨාශය ලෙස සැලකෙන මොවුන්
ප්‍රධාන වශයෙන් ජීවත් වන්නේ මහද්වීපික තටාකවල නොගැඹුරු මුහුදු ප්‍රදේශයේය.
මුහුදු ක්ෂීරපායියෙකු වන ඩොල්ෆින් විද්‍යාත්මක වර්ගීකරණය කිරීමේදී සිටේසියානු ගෝත්‍රයට අයත්වේ.

(කට පාඩම් නොකරන්න. දැනුමට පමණයි.)

අන්ර්තගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඹපනායක